සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ගෘහ ආර්ථික විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / **Paper**: **I,II**

## ගෘහ ආර්ථික විද්‍යාව I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 2 | (11) | 2 | (21) | 1 | (31) | 1 |
| (2) | 3 | (12) | 1 | (22) | 4 | (32) | 3 |
| (3) | 4 | (13) | 4 | (23) | 2 | (33) | 4 |
| (4) | 1 | (14) | 4 | (24) | 3 | (34) | 2 |
| (5) | 4 | (15) | 2 | (25) | 4 | (35) | 3 |
| (6) | 3 | (16) | 4 | (26) | 2 | (36) | 1 |
| (7) | 2 | (17) | 3 | (27) | 1 | (37) | 2 |
| (8) | 3 | (18) | 2 | (28) | 3 | (38) | 4 |
| (9) | 4 | (19) | 4 | (29) | 2 | (39) | 3 |
| (10) | 1 | (20) | 1 | (30) | 4 | (40) | 1 |

එක් පිළිතුරකට ලකුණු 01 බැගින්
මුළු ලකුණු 01 × 40 = 40

## ගෘහ ආර්ථික විද්‍යාව II

| | | | | | |
|---|---|---|---|---|---|
| (01) ප්‍රශ්නය - | එක් කොටසකට ලකුණු 02 බැගින් 02 × 10 | | | = | 20 |
| (02) ප්‍රශ්නය - | (1) 03 | (2) 03 | (3) 04 | = | 10 |
| (03) ප්‍රශ්නය - | (1) 03 | (2) 03 | (3) 04 | = | 10 |
| (04) ප්‍රශ්නය - | (1) 03 | (2) 03 | (3) 04 | = | 10 |
| (05) ප්‍රශ්නය - | (1) 03 | (2) 03 | (3) 04 | = | 10 |
| (06) ප්‍රශ්නය - | (1) 03 | (2) 03 | (3) 04 | = | 10 |
| (07) ප්‍රශ්නය - | (1) 03 | (2) 03 | (3) 04 | = | 10 |

(02)–(07): ප්‍රශ්න 4කට ලකුණු 10 බැගින් = 40

මුළු ලකුණු: 100

(01) (i) ගෙවතු අලංකරණයේ නියැලීමෙන් අත්වන වාසි,

- අලංකාරයක් හා දකුම්කලු බවක් ඇතිවේ.
- පරිසරයෙහි දර්ශනීය බවක් ඇති කර ගත හැකිය.
- මානසික තෘප්තියක් ඇතිවේ.
- ආර්ථික වාසි අත්කර ගත හැකිවේ.
- තම විවේක කාලය ඵලදායීව ගත කළ හැකිවේ.
- නිවසේ සාමාජිකයින්ගේ නිර්මාණශීලී බව ඉස්මතු වේ.

(කරුණු 4ට ලකුණු 2යි)

(ii) අවධාරණය ඇතිකර ගැනීම සඳහා යොදා ගත හැකි උපාංග,

- බුමුතුරුණු
- බිත්ති සැරසිලි
- ලාම්පු හා ලාම්පු ආවරණ
- විදුලි පහන්
- මල් සැකසුම්
- මල් පෝච්චි
- කුෂන්
- විසිතුරු භාණ්ඩ

(උපාංග 4ට ලකුණු 2යි)

(iii) කළමනාකරණ ක්‍රියාවලිය යනු අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා සීමිත සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝගී කරගැනීමේ ක්‍රියාවලියකි. (ලකුණු 02යි)

(iv) ළදරුවාගේ පෝෂණය පිළිබඳව වැදගත්වන කරුණු,

- ඉපදී පළමු මාස 6 මව්කිරි පමණක් දීම.
- මාස 6න් පසු අතිරේක ආහාරවලට හුරු කිරීම.
- අවම වශයෙන් අවුරුදු දෙකක්වත් මව්කිරි දීම.
- අතිරේක ආහාර දීමේ දී විශේෂ පෝෂණ අවශ්‍යතා පිළිබඳව සැලකිලිමත් වීම.
- විවිධ ප්‍රචාරණයන්ට නොරැවටී ගුණාත්මක බවින් යුතු ආහාර මාස 6න් පසු ලබාදීම.

(ලකුණු 2කට ලකුණු 2යි)

(v) මුල් ළමා අවධියේ දරුවකුට ආහාරවේල් සැලසුම් කිරීමේ දී

- දෛනික පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා කුඩා ආහාරවේල් කිහිපයක් ලබාදීම.
- ආහාර වේල්වල විවිධත්වයක් තිබීම. (වර්ණය, රසය, වයනය)
- රුචිය වඩවන ආහාර ඇතුළත් කිරීම.
- ප්‍රමාණාත්මක බවට වඩා ගුණාත්මක බව පිළිබඳ අවධානය යොමු කිරීම.

(ලකුණු 2කට ලකුණු 2යි)

(vi) අර්ධ ඝන ආහාර,

- ධාන්‍ය කැඳ
- අර්ධ ඝන කැඳ
- එළවළු මිශ්‍ර සුප්
- පලතුරු පල්පය
- අල මිශ්‍රිත කලාපය

(ආහාර වර්ග දෙකකට ලකුණු 2යි)

(vii) ළමා ගවුම නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු,

- ඇඟලෑමට හා ගැලවීමට පහසුව.
- උචිත පියවීමේ ක්‍රම යොදා තිබීම.
- ලිහිල්ව මසා තිබීම.
- ඇඳුමෙහි මූට්ටු හා නිමාව දරුවාගේ සමට සුවපහසු වීම.
- විසිතුරු හා අලංකාර බවකින් යුක්ත වීම. (කරුණු 2කට ලකුණු 2යි.

(viii) ළමා ගවුම සඳහා රෙදි තෝරා ගැනීමේ දී

- කපු රෙදි වර්ග තෝරා ගැනීම.
- තනි පැහැ මෙන්ම කුඩා මෝස්තර සහිත මුද්‍රිත රෙදි තෝරා ගැනීම.
- දහඩිය හා තෙතමනය අවශෝෂණය කළ හැකි රෙදි තෝරා ගැනීම.
- සේදීමට ඔරොත්තු දෙන රෙදි වර්ග වීම.
- වියළීමට හා මැදීමට ඔරොත්තු දීම.
- සැහැල්ලු හා විවිධ වර්ණවලින් යුත් රෙදි වර්ග තෝරා ගැනීම. (කරුණු 2ට ලකුණු 2යි)

(ix) දිවා සුරැකුම් මධ්‍යස්ථානයක පාලිකාවක සතු විය යුතු ගුණාංග

- ආදරය, කරුණාව, දයාව, ඉවසීම.
- නිර්මාණශීලී බව.
- සැමට එකසේ සැලකීම.
- ප්‍රසන්න භාවිතයන්ගෙන් යුක්ත වීම.
- දරුවන් හොඳින් රැකබලා ගැනීම.
- දරුවන්ගේ ස්වස්ථතාව පිළිබඳ සැලකිලිමත් වීම. (කරුණු 4ට ලකුණු 2යි)

(x) පියාගේ රැකියාව පවුලේ සෞඛ්‍ය කෙරෙහි බලපාන ආකාරය

- පෝෂණය පිළිබඳ යහපත් ආකල්ප හා නිසි දැනුම.
- යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම.
- සෞඛ්‍ය සේවා නිසි ලෙස ලබාගත හැකි වීම.
- තම නිවස හා ගෙවත්ත පිරිසිදුව තබා ගැනීමට උනන්දු වීම. (කරුණු 2ට ලකුණු 2යි)

(02) (i) නිවසේ භාවිතවන ගෘහ පිළිවලට උදාහරණ

- විසිත්ති කාමරයට - කුෂන් කවර, ටීපෝ රෙදි, පුටු කවර
- නිදන කාමරයට - ඇඳ ඇතිරිලි, ඇඳ ආවරණ, මෙට්ට කවර, කොට්ට උර, මදුරු දැල්
- කෑම කාමරයට - මේස රෙදි, අනු ඇතිරිලි, අත් පිස්නා, බන්දේසි කවර, දීසි පිස්නා
- නාන කාමරයට - තුවා, අත් පිස්නා (කරුණු 3ට ලකුණු 3යි)

(ii) කුෂන් කවරයක විවරය පියවීම සඳහා

- බොත්තම් හා කාස මැසීම.
- දෙපෙති ජන්තු ඇල්ලීම.
- සැනගාංචු යෙදීම.
- වෙල්කෝ ටේප් ඇල්ලීම. (ක්‍රම 3ට ලකුණු 3යි)

(iii) ළමා ගවුමේ සාය කොටසට අවශ්‍ය රෙදි ප්‍රමාණය

- 1 m හා 32 cm ක් පළල
  35 cm ක් උස රෙදි ප්‍රමාණයක් අවශ්‍ය වේ. (රෙදි ප්‍රමාණයට ලකුණු 2යි)
- මැහුම් වාසි

  අංශය - 1.5 cm

  ඉන - 1 cm

  වාටිය පළල - 3 cm

(03) (i) එළවළු හා පළතුරු ආහාරයට ගැනීමේ ප්‍රයෝජන

- නැවුම් එළවළු හා පලතුරුවල පෝෂණ අගය ආරක්ෂා වී ඇත.
- ප්‍රතිඔක්සිකාරක අඩංගු වේ.
- සෙලියලෝස් (තන්තු) බහුලව පවතී.
- තන්තු නිසා ක්‍රමකුංචන ක්‍රියාවලිය පහසු කර මලබද්ධය වළක්වයි.
- ආන්ත්‍රික පිළිකා වළක්වයි. (කරුණු 3ට ලකුණු 03)

(ii) (1) සේදීම

(2) කැපීම

(3) රස ගැන්වීම හා මිශ්‍ර කිරීම

(කරුණු 3ට ලකුණු 3යි)

(iii) ආහාර තෝරා ගැනීමේ දී පාරිභෝගිකයන්ට මුහුණ පෑමට සිදුවන දුෂ්කරතා

- අලෙවිකරුවන්ගේ නොසැලකිලිමත් බව
- ආර්ථික දුෂ්කරතා
- ආහාර ප්‍රමිතියෙන් තොර වීම
- පාරිභෝගිකයන්ගේ නොදැනුවත්කම (කරුණු 4ට ලකුණු 4යි)

(04) (i) ජීර්ණ යුෂ ශ්‍රාවය කරන ඉන්ද්‍රියයන් - බේට ග්‍රන්ථි, අග්න්‍යාසය, අක්මාව, පිත්තාශය

(ii) මහා පෝෂකවල ජීර්ණයෙහි අවසාන ඵලයන්,

- කාබෝහයිඩ්‍රේට් - මොනොසැකරයිඩ (ග්ලූකෝස්, ෆ්‍රක්ටෝස්, ගැලැක්ටෝස්)
- ප්‍රෝටීන් - ඇමයිනෝ අම්ල
- ලිපිඩ - මේද අම්ල සහ ග්ලිසරෝල් (කරුණු 3කට ලකුණු 3යි)

(iii) (අ) ආහාර පිළිගැන්වීමේ දී සංග්‍රාහකයා විසින් අනුගමනය කළ යුතු කරුණු,

- එක් පුද්ගලයකු සඳහා 18' × 22" ඉඩ ප්‍රමාණයක් තැබීම.
- ගෘහ මූලිකයා හා ගෘහ පාලිකාව මේසය දෙපැත්තේ හිඳ ගැනීමට සැලැස්වීම.
- සුහදශීලීව හා ආචාරශීලීව ආහාර පිළිගැන්වීම.
- ආහාර පිළිගැන්වීම වම් පසින්ද බඳුන් ඉවත් කිරීම දකුණු පසින් ද සිදු කිරීම.
- ආහාර අනුභව කර අවසන් වූ පසු ආහාරගත් බඳුන් වහාම ඉවත් කිරීම.


(කරුණු 2ට ලකුණු 2යි)

(ආ)
- බාහිර ආසෘති ක්‍රියාවලිය යනු, වැඩි ජල සාන්ද්‍රණයකට සිට අඩු ජල සාන්ද්‍රණයක් දක්වා අර්ථ පාරගම්‍ය පටලයක් හරහා ජල අණු ගමන් කිරීමයි.

(ලකුණු 01)

- විසරණය යනු, සාන්ද්‍රණය වැඩි තැනක සිට සාන්ද්‍රණය අඩු තැනකට ගමන් කිරීමයි. (ලකුණු 01)

(05) (i)




වර්ණයක වටිනාකම / අගය මැනීම සඳහා වර්ණ අගමනාය භාවිත වේ. මෙය වර්ණයක අගය හෝ වටිනාකම දක්වන දර්ශකයක් හෙවත් මානයකි. එය වර්ණක ලා බවේ සිට තද බව හෝ තද බවේ සිට ලා බව දක්වයි. (ලකුණු 1)

රතු වර්ණය සඳහා වර්ණ අගමානයක් සැකසීමේ දී ලා පැහැයට ගැනීමට සුදු වර්ණ ක්‍රමයෙන් එකතු කිරීම හා තද පැහැයට ගැනීමට කළු වර්ණය ක්‍රමයෙන් එකතු කිරීම සිදුකෙරේ. (ලකුණු 02)

(ii) ගෙවත්තේ පාංශු සංරක්ෂණය සඳහා ගත හැකි පියවර

- පඳුරු සහිත ශාක වැවීම.
- කාණු පද්ධතිය සකස් කිරීම.
- ගල් වැටි යෙදීම.
- පිඩලි ඇල්ලීම.

(iii) නිවසින් බැහැර කෙරෙන ජලය ප්‍රයෝජනයට ගත හැකි ආකාරය

- බෝගවලට ගලා යාමට සැලැස්වීම.

- රෙදි සෝදන ජලය කාණු පිරිසිදු කිරීමට යොදා ගැනීම.
- නල හා කාණු පද්ධතියක් මගින් කොහිල කොටු වැනි කෘෂිකාර්මික කටයුතුවලට යොදා ගැනීම. (කරුණු 2කට ලකුණු 4)

(06) (i) ප්‍රාථමික ලිංගික ලක්‍ෂණ පිළිබඳ අදහස්

නව යොවුන් වියේ ආරම්භයත් සමඟ ලිංගික හෝර්මෝනවල බලපෑම නිසා සිදුවන ප්‍රජනක ඉන්ද්‍රිය පද්ධතිය සීඝ්‍ර වර්ධනය ප්‍රාථමික ලිංගික ලක්‍ෂණ ඇතිවීම ලෙස හැඳින් වේ.
උදා : ඩිම්බ කෝෂ හා ගර්භාෂ වර්ධනය / වෘෂණ කෝෂ හා වෘෂණ වර්ධනය

(හැදින්වීමට ලකුණු 2යි)

(උදාහරණයට ලකුණු 1යි)

(ii) යෞවනයාගේ මානසික වර්ධනය බාහිරව පෙන්නුම් කරන ආකාරය.

- ගැටලු විසඳීමේ චින්තනය.
- නිර්මාණශීලී බව.
- අදහස් නිරවුල්ව ප්‍රකාශ කිරීම.
- නායකත්වය දැරීමේ හැකියාව.
- අවස්ථානෝචිතව හැසිරීම් දක්ෂතාව. (කරුණු 03ට ලකුණු 03)

(iii) ගර්භණී මවක් අයඩින් ඌනතාවට මුහුණ දීම නිසා,

- ගබ්සා වීම
- මළදරු උපත් ඇතිවීම.
- ප්‍රාග් පරිණත දරු උපත් ඇතිවීම.
- මන්ද මානසික දරු උපත් ඇතිවීම. (කරුණු 4ට ලකුණු 4යි)

(07) (i) දරුවාගේ සංවර්ධනය බලපාන්නාවූ වැදගත් සාධක

- ආරය - මවගෙන්, පියාගෙන් උරුම වන ජාන මගින්.
- පරිසරය - ආරමය ලක්‍ෂණ බාහිර පරිසරය මගින් වෙනස් විය හැකිය.
- මේරීම - වයස මුහුකුරා යත්ම චර්යාවන්හි වෙනස්කම් ඇති වීම.
- ඉගෙනීම - පුද්ගල අවශ්‍යතා මත වීර්යයෙන් හා උත්සාහයෙන් ඇති කර ගනු ලබන හැකියාවන් හා දැනුම

(එකක් විස්තර කර ඇත්නම් ලකුණු 1)

(ii) එන්නත් ලබාදෙන වයස් සීමවන්

- ජැපනීස් එන්සෙපලයිටීස් - මාස 9 අවසානයේ දී
- ත්‍රිත්ව එන්නත සිව්වන මාත්‍රාව - මාස 18 දී
- ATD එන්නත - අවුරුදු 12 දී (කරුණු 3ට ලකුණු 3)

(iii) යොවුන් වියේ සමාජ සංවර්ධනය පිළිඹිබු කරන ලක්‍ෂණ,

- සම වයස් කණ්ඩායම් කෙරෙහි නැඹුරු වීම.
- රංචු ලැදියාව.
- ලිංගිකතාව (විරුද්ධ ලිංගික ආකර්ශනය)
- වැඩිහිටි ආධිපත්‍යයෙන් මිදීමට උත්සාහ කිරීම.
- වීරාභිවන්දනය.
- යුක්තිය, සාධාරණය, සත්‍ය වැනි සංකල්ප ඇගයීම.
- විලාසිතාවලට නැඹුරුව.
- ස්වීයත්වය ගොඩ නගා ගැනීමට උත්සාහ කිරීම.

(කරුණු 4ට ලකුණු 4යි)